ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ නිලධාරීන් II "ආ" පන්තියේ සිට II "අ" පන්තියට
උසස් කිරීමේ විභාගය - 2018

ලිතෝ මුද්‍රණ ශිල්පය I

01003

(ලිතෝ මුද්‍රණ ශිල්පීන් සඳහා)

2018 - 06 - 18 | කාලය පැය 3යි | පැය 0900 සිට 1200

සියලුම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න

---

1. (i) සමතල මුද්‍රණය (Surface) සහ උන්නත මුද්‍රණය (Letter Press / High Relief) යන ක්‍රම දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) ලිතෝ මුද්‍රණ ක්‍රමයෙහි භාවිතාවන මූලධර්මය විස්තර කරන්න.

(ලකුණු 06)

(iii) ඉහත (i) හි මුද්‍රණ ක්‍රම දෙකෙන් මුද්‍රණය කරනලද පිටපත් වෙන්කර හඳුනාගත හැක්කේ කෙසේද ?

(ලකුණු 06)

2. (i) මුද්‍රණ කර්මාන්තය සඳහා භාවිතා කරණ මුද්‍රණතැටි වර්ග මොනවාද ?

(ලකුණු 05)

(ii) එම තැටි ආලෝක සංවේදී කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් වෙන වෙනම දක්වන්න.

(ලකුණු 15)

3. භාවිතා කරනු ලැබූ මුද්‍රණ තැටි නැවත භාවිතා කිරීමට හැකිවන පරිදි ආරක්ෂිතව ගබඩාකර තැබීමට ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 20)

4. (i) මුද්‍රණ කර්මාන්තයේදී භාවිතාවන මූලික සංකලන වර්ණ (Additive Primary Colours) හා ද්විතියික ඌණිත වර්ණ (Secondary Subtractive Colours) වෙන වෙනම දක්වන්න.

(ලකුණු 05)

(ii) වර්ණ දෙකක් සුදු කඩදාසියක් මත මුද්‍රණය කිරීමෙන් කොල වර්ණය ලබාගත හැකි ආකාරය රූප සටහනක් ආධාරයෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

5. "මුද්‍රණ ශිල්පියා රාජකාරී ඉටුකිරීමේදී මනා කායික සහ මානසික තත්ත්වයේ සිටීම අනිවාර්යවේ" ඉහත ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 20)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ නිලධාරීන් II "ආ"පන්තියේ සිට II "අ" පන්තියට
උසස් කිරීමේ විභාගය - 2018

ලිතෝ මුද්‍රණ ශිල්පය II

000203

(ලිතෝ මුද්‍රණ ශිල්පීන් සඳහා)

2018- 06 -18

කාලය පැය 3යි

පැය 1300 සිට 1600

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

---

1. (i) රොටරි ඕfස්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍රයක පැහැදිලි රූපසටහනක් ඇඳ එහි කොටස් විස්තර කරන්න.

(ලකුණු 14)

(ii) fප්ලැට් බෙඩ් සහ රොටරි ඕfස්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍රවල වාසි අවාසි විස්තර කරන්න.

(ලකුණු 06)

2. (i) 1 : 50,000 සිතියමක් මුද්‍රණය කිරීමේදී පැරණි ක්‍රමය අනුව භාවිතාකල හා නව ක්‍රමය අනුව භාවිතා කරණ තැටි ගණන කීයද ?

(ලකුණු 05)

(ii) මෙම ක්‍රම දෙකෙහි වාසි අවාසි විස්තර කරන්න.

(ලකුණු 15)

3. (i) මුද්‍රණ අංශයේ පවත්වා ගතයුතු පරිසර තත්ත්වයන් මොනවාද?

(ලකුණු 08)

(ii) කඩදාසියක දෙපැත්තම මුද්‍රණය කිරීමේදී මතුවන ගැටලු මොනවාද? ඒවා මගහරවා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද?

(ලකුණු 12)

4. (i) "ලිතෝ මුද්‍රණ අංශය සිතියම් මුද්‍රණයට අමතරව අනෙකුත් ශාඛාවල අවශ්‍යතාවයන්ද ඉටුකරදෙයි." විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) සිතියම් ආදිය මුද්‍රණයෙන් පසු අදාල අංශවලට භාරදෙන තෙක් ගබඩාකර තැබියයුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5. මුද්‍රණයේදී ඇතිවන අනතුරු වලක්වා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 20)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ නිලධාරීන් II "ආ" පන්තියේ සිට II "අ" පන්තියට
උසස් කිරීමේ විභාගය - 2018

ලිතෝ මුද්‍රණ ශිල්පය III

000003

(ලිතෝ මුද්‍රණ ශිල්පීන් සඳහා)

2018 - 06 - 19

කාලය පැය 3 යි

පැය 0900 සිට 1200

සියලුම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න

---

1. (i) සිතියමක හෝ පිඹුරක පරිමාණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 05)

(ii) ප්‍රධාන විදුලි රැහැන් පද්ධතියක කනු දෙකක් අතර දුර මීටර් 500 කි. මෙම කනු දෙක 1 : 4,000 පරිමාණයේ පිඹුරක සහ 1 : 10,000 පරිමාණයේ සිතියමක පෙන්වීමේදී එම කනු දෙක අතර දුර මිලිමීටර් කීයකින් පෙන්විය යුතුද ?

(ලකුණු 07)

(iii) අධිවේගී මාර්ගයක් සඳහා ඉඩම් අත්පත් කරගැනීමකදී සාදනලද 1 : 1,000 පරිමාණයේ පිඹුරක සෙ.මී. 15 ක් පළල සෙ.මී. 3 ක් දිග සෘජුකෝණාස්‍රාකාර ඉඩම් කොටසක් ඇත. හෙක්ටයාරයකට රුපියල් ලක්ෂ 15 ක වන්දි මුදලක් ලැබේ නම් මෙම ඉඩම් කොටස අයිතිකරුට ලැබෙන වන්දි මුදල කොපමණද?

(ලකුණු 08)

2. (i) සිතියම් සඳහා සංකේත භාවිතා කරන්නේ ඇයි ? *(ලකුණු 05)*

(ii) සිතියම් සඳහා භාවිතාකරන සංකේත වර්ග තුන උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 15)

3. (i) ලිතෝ අංශයට මුද්‍රණය සඳහා ඉදිරි වර්ෂයේදී අවශ්‍යවන ද්‍රව්‍ය ලැයිස්තුවක් පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ii) මේවා කුමන ප්‍රමාණ වලින් ලබාගන්නේ දැයි තීරණය කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද?

(ලකුණු 10)

4. (i) "නිවාඩු ලබාගැනීමේ අවශ්‍යතාවයන් හැකි පමණ කල්වේලා ඇතිව ශාඛා ප්‍රධාන වෙත දැනුම්දීම ශාඛාවේ රාජකාරී පවත්වා ගැනීමට උපකාරීවේ"
මෙම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) රාජකාරී කිරීමේදී සිදුවන අනතුරු සඳහා නිවාඩු ලබාගැනීමේ ක්‍රියාමාර්ගය විස්තර කරන්න.

(ලකුණු 10)

5. ශාඛාවේ ඵලදායිතා කවයේ යාමාජිකයකු වශයෙන් ශාඛාවේ රාජකාරීවල දියුණුව සඳහා සුදුසු යෝජනා පැහැදිලි කරන්න.

(ලකුණු 20)